**කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය උසස් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය - 2015**

---

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය උසස් කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කොරියානු අපනයන - ආනයන බැංකුව අතර 2013 ජූලි 23 දින එළඹි අංක 2013033/එස්එල්-එස්ආර්අයි-22 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට තරුණ කටයුතු හා කුසලතා සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ කුසලතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, කොළඹ හා ගම්පහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 02 ක් පිහිටුවීම හා සංවර්ධනය කිරීම සහ තාක්ෂණික මාරු කිරීම් හා ආර්ථික සංවර්ධනයේදී කොරියානු විශේෂඥයින්ගේ සහාය සහිතව කර්මාන්ත වර්ධනයට අනුබලදීම හා මානව සම්පත් සංවර්ධනයේදී ප්‍රධාන කාර්ය භාරයක් සිදුකිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 31.41 ක් වන අතර ඉන් එජඩො මිලියන 26.05 ක් කොරියානු අපනයන - ආනයන බැංකුව විසින් මූල්‍යායනය කිරීම සඳහා එකඟවී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 නොවැම්බර් 18 දින ආරම්භ කරන ලද අතර 2016 නොවැම්බර් 18 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

ව්‍යාපෘතිය විසින් අවස්ථා 11 කදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතුව රු.මිලියන 1.62 ක්වූ එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 ඡේදයේ නියමය පරිදි විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඊළඟ මාසයේ 15 දිනට හෝ ඊට පෙර දන්වා නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් - සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් - 2015 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ඊඩීසීඑෆ් | 26.05 | 3,460.53 | 11.42 | 0.89 | 108.72 | 0.89 | 108.72 |
| ශ්‍රීලංර | 5.36 | 711.48 | 0.87 | 0.18 | 25.72 | 0.19 | 26.40 |
| | 31.41 | 4,172.01 | 12.29 | 1.07 | 134.44 | 1.08 | 135.12 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම, උපදේශකවරුන්ට හා කළමනාකරුවන්ට විදේශ පුහුණු හා දේශීය පුහුණු ලබාදීම ආදී කාර්යයන් ණය ගිවිසුමේ දිනයේ සිට මාස 30 ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුමේ දිනයේ සිට මාස 12 ක කාලයක් ඉකුත්වීමෙන් පසුව, ගොඩනැඟිලි ඉදිකිරීමේ වැඩ සඳහා උපදේශකවරයකු තෝරා ගැනීමට පමණක් ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කැපවුණු කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යයන් අඩු ප්‍රගතියක් දක්වා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත නිරික්ෂණයන් කරන ලදි.

(අ) ව්‍යාපෘතිය විසින් 2014 අගෝස්තු 22 දින එජඩො මිලියන 2.23 ක පිරිවැයකට විදේශ සමාගමකට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා උපදේශක කාර්යයන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද ගොඩනැගිලිවල විස්තරාත්මක සැලසුම් හා උපකරණ ආදිය ප්‍රසම්පාදනය සඳහා පිරිවිතරයන් පිළියෙල කිරීම 2015 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) මායිම් බිත්තියක් ඉදිකිරීම සඳහා රු.මිලියන 53.32 ක පිරිවැයකට දේශීය සමාගමකට පිරිනමන ලද කොන්ත්‍රාත්තුව 2015 නොවැම්බර් 10 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණද, 2015 දෙසැම්බර් 31 වන විටත් නිමකර නොතිබුණි. කෙසේ වුවද අදාළ කොන්ත්‍රාත්තුව මත 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 24.16 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත නිරික්ෂණයන් කරන ලදි.

(අ) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 09 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ රාජකාරී ආවරණය කිරීම සඳහා අර්ධ කාලීන පදනම මත නිලධාරීන් තිදෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.4 ඡේදය ප්‍රකාරව, ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්ය මණ්ඩලය ඇතුළත් තනතුරු වලට බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ දැන්වීම් මඟින් ඉල්ලුම්පත් කැඳවීමෙන් හා පසුව සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගැනීම සිදුකළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු ඒ අනුව බඳවා ගෙන නොතිබුණි.

(ආ) තවද, ව්‍යාපෘතිය විසින් බඳවා ගන්නා ලද නිලධාරීන් දෙදෙනෙකු සඳහා 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.9 ඡේදයේ දක්වා ඇති පරිදි ප්‍රමාණවත් පළපුරුද්දක් නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.5 මූල්‍ය පාලන පිළිබඳ ගැටළු**

**--------------------------**

ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට භාජනය කර නොතිබුණි.